**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**
**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
**Ministry of Finance**
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/2/Ad/03/DO | ඔබේ අංකය / உமது இல / Your No: ........................ | දිනය / திகதி / Date: 2021.06.04 |

සියළුම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන්,

දිස්ත්‍රික් විගණන කණ්ඩායම් නායකවරුන් වෙත.

**2019 වර්ෂයේ අදියර II හා අදියර III වශයෙන් බඳවාගෙන ඇති උපාධිධාරී අභ්‍යාසලාභීන් සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීම හා රාජකාරී කටයුතු පවත්වාගෙන යාම**

2019 වසරේ උපාධිධාරි අභ්‍යාසලාභී යෝජනා ක්‍රමය යටතේ පුහුණුව ලැබූ උපාධිධාරින් 780 කට ආසන්න පිරිසක් ස්ථිර පදනම මත මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරන ලදී.

02. එම පිරිස මෙම දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවය පදනම් කර ගනිමින් ප්‍රාදේශීය විගණන ඒකක 140 ක් වෙත රාජකාරී සඳහා ස්ථානගත කරන ලදී.

03. මෙම නිලධාරින් අතුරින් තමන් හැදෑරූ උපාධිය පදනම් කර ගනිමින් අභ්‍යන්තර විගණන, ප්‍රජා මූල සංවිධාන, අලෙවි, විශ්‍රාම වැටුප්, ආයතන, තොරතුරු තාක්ෂණ හා ගිණුම් යන විෂය ධාරාවන් වෙනුවෙන් බෙදා වෙන් කර ඇත. මෙම නිලධාරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අත්‍යාවශ්‍ය රාජකාරී සඳහා අනුයුක්ත කිරීමක් හැරුණු කොට සෙසු සියළුම නිලධාරින්ගේ සේවා ස්ථානය වන්නේ ප්‍රාදේශීය විගණන ඒකකය සහිත බැංකු සමිති බව සඳහන් කරමි.

04. නිලධාරින් විසින් තමන්ගේ රාජකාරී කටයුතු ප්‍රාදේශීය විගණන ඒකකයේ සිට ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ බැංකු සමිති හා බැංකු කලාපවල ඉටු කළ යුතු අතර, එම රාජකාරීවල අවසන්


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

ප්‍රගතිය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ මඟින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ආකාරයට සැළසුම් සකස් කළ යුතුය.

05. වඩාත් කාර්යක්ෂම සේවාවක් වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුවේ විගණන අංශය ශක්තිමත් කිරීම සඳහා නිලධාරීන් වැඩි පිරිසක් විගණන කටයුතු සඳහා ප්‍රාදේශීය විගණන ඒකක වෙත ස්ථාන ගත කර ඇති අතර, එම අයගේ රාජකාරී කටයුතු ද ප්‍රාදේශීය විගණන ඒකකය යටතේ වන බැංකු හා බැංකු සමිති, ප්‍රජාමූල සංවිධාන, ග්‍රාමීය මට්ටමේ ව්‍යාපෘති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශය විගණන කටයුතු සිදු කළ යුතු අතර, එම විගණන වාර්තා දිස්ත්‍රික් විගණන කණ්ඩායම් නායක මඟින් ප්‍රධාන අභ්‍යන්තර විගණක මඟින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

06. ප්‍රජාමූල සංවිධාන, අලෙවි, විශ්‍රාම වැටුප්, ආයතන, ගිණුම්, තොරතුරු තාක්ෂණ යන විෂයන් වලට අනුයුක්ත කර ඇති නිලධාරීන් ද ප්‍රාදේශීය විගණන ඒකක සහිත බැංකු සමිති හා බැංකු කලාප කාර්යාලවල සිට රාජකාරි ඉටුකළ යුතුය.

07. ඒ අනුව, මෙම දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු පහසු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සැළසුම් කරන ලද ප්‍රාදේශීය විගණන ඒකක වෙත දැනටමත් අනුයුක්ත කර ඇති නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් හෝ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ නිර්දේශ මත මාගේ පූර්ව අවසරයකින් තොරව වෙනත් කාර්යාල වෙත ස්ථාන මාරු වීම් නොකිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

| | | | |
|---|---|---|---|
| 1. | ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | - | කා.දැ.ගැ.ස. |
| 2. | ප්‍රධාන ගණකාධිකාරි | - | අ.ක.ස. |
| 3. | ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | දැ.ගැ.ස. |
| 4. | සියළුම අංශ ප්‍රධානීන් වෙත | - | දැ.ගැ.ස. |